(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 10(4).]

# පාර්ලිමේන්තුවේ අංක 10 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2014 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා**

---

## 2014 මාර්තු මස 18 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3695/'13

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ලංකා බැංකුව මගින් 2013.03.06 වැනි දින රිවිර පුවත්පතේ දැන්වීමක් පළ කළේද;

(ii) එම දැන්වීම පළ කිරීමේ අරමුණ කුමක්ද;

(iii) එම දැන්වීම වෙනුවෙන් ලංකා බැංකුව විසින් වැය කරන ලද මුදල කොපමණද;

(iv) එම මුදල් කවර වැය ශීර්ෂය යටතේ වැය කළේද;

(v) යම් දේශපාලන පක්ෂයක, යම් තනතුරක් සඳහා යම් පුද්ගලයකු පත්වූ විට ඊට අදාළව ලංකා බැංකුවට දැන්වීම් පළ කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 මාර්තු මස 19 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1946/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) දැනට වර්ෂයක පමණ කාලයක සිට, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන පිහිටා ඇති සුදු කොහු කර්මාන්ත ශාලාව වසා දමා ඇති බැවින් ප්‍රදේශයේ විශාල ජනතාවකට රැකියා අහිමිව දැඩි ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුවී ඇති බවත්;

(ii) එම සුදු කොහු කර්මාන්ත ශාලාව ආශ්‍රිත මධ්‍යස්ථානය මගින් රැකියා නොමැති තරුණ තරුණියන් ස්වයං රැකියාවලට යොමු කිරීමේ අරමුණින් පුහුණු පාඨමාලාවක් ද පවත්වාගෙන ගිය බවත්;

(iii) නව නිර්මාණ සඳහා ජනාධිපති සම්මාන පවා හිමි කරගත් එම ආයතනය වසා දැමීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, නැවතත් මෙම කර්මාන්ත ශාලාව ආරම්භ කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2713/'12

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2012 මාර්තු මස ජිනීවාහි පැවති මානව හිමිකම් කවුන්සිලයට ශ්‍රී ලංකාවට එරෙහි යෝජනාවක් ගෙන ඒමට පෙර, ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය ලේකම්වරයා සමග නිල වශයෙන් පළමු හමුවීම පැවැත්වුණු දිනය කවරේද;

(ii) එකී හමුවීමෙහි දී සාකච්ඡාවට ලක්වූ කරුණු කවරේද;

(iii) ඉහත හමුවීමෙන් අනතුරුව, ඇමරිකා එක්සත් ජනපදය විසින්ද ඉහත දැක්වූ ආකාරයේ යෝජනාවක් ගෙන එන්නට ඉඩ තිබෙන බව අපේක්ෂා කරනු ලැබුවේද;

(iv) ශ්‍රී ලාංකීය දෘෂ්ටිකෝණයෙන් ගත් කල ඉහත කී යෝජනාව පරාජයවීමට නොසැලකිලිමත්භාවය, උද්ධච්චභාවය සහ අදක්ෂතාව හේතු වූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජිනීවාහිදී සම්මතවූ යෝජනාව සම්බන්ධයෙන් අද වනවිට ප්‍රතිකර්ම වශයෙන් ගෙන ඇති පියවර කවරේද;

(ii) පැවති ස්ථාවරයට පටහැනිව යමින් 2012 මැයි මස 18 වැනි දිනදී ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් මහත්මිය හමුවීමට රජය කැමැත්ත පළ කළේ මන්ද;

(iii) එහිදී සාකච්ඡා කළ කරුණු සහ එකී හමුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස දැන් ක්‍රියාත්මක වන කටයුතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 207/'14

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු පී. හැරිසන් මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු මංගල සමරවීර මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු රෝසි සේනානායක මහත්මිය

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු වසන්ත අලුවිහාරේ මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු රුවන් විජයවර්ධන මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු විජයදාස රාජපක්ෂ මහතා

ගරු ඒ. ඩී. චම්පික ප්‍රේමදාස මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු කරු ජයසූරිය මහතා

ගරු කබීර් හෂීම් මහතා,— රජය කෙරෙහි විශ්වාස භංගත්වය,— අග්නිදිග ආසියාව හා ගල්ෆ් වෙරළ සිසාරා ක්‍රියාත්මක වන ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ජාවාරම් සමූහයක් ඇති බව ඇෆ්ගනිස්ථානයේ, පකිස්ථානයේ, ඉන්දියාවේ සහ තවත් රටවල පොලිස් විමර්ශන මගින් හෙළිදරව් වී ඇතැයි මාධ්‍ය මගින් වාර්තා කර ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ අනෙක් රටවලට හෙරොයින් බෙදාහරින කේන්ද්‍රස්ථානය බවට පත් කරමින් ඇෆ්ගනිස්ථානයේ නිෂ්පාදිත හෙරොයින්,

(1) පකිස්ථානයට ගෙනැවිත් එතැනින් ශ්‍රී ලංකාව වෙත යොමු කෙරෙතැයි, හා

(2) පකිස්ථානයට හා පන්ජාබ් දේශ සීමාව හරහා ඉන්දියාවට ගෙනැවිත් අවසානයේදී ශ්‍රී ලංකාවට ගෙනෙතැයි,

එම විමර්ශනයන්ගෙන් හෙළිදරව් වී ඇති හෙයින්ද;

මෙම මත්ද්‍රව්‍ය ජාවාරම් සමූහය කලාපයේ යහපැවැත්මට තර්ජනයක් බවට පත් වී ඇති හෙයින්ද;

මෙම ජාවාරම් සමූහයට පකිස්ථානු, ඉන්දීය හා ශ්‍රී ලාංකික ජාතිකයින් සම්බන්ධව සිටින බවට එම විමර්ශන වලින් හෙළිදරව් වී ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාවේ අස්සක් මුල්ලක් නැර සෑම තැනකම මෙම මත්ද්‍රව්‍ය තිබෙන හෙයින් හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ලාබාල අය හෙරොයින් භාවිතා කිරීම වැඩි වී ඇති හෙයින්ද;

අග්‍රාමාත්‍ය රාජීව් ගාන්ධි මහතා ඝාතනය කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර පොලිසියට අවශ්‍යව ඇති සහ කුඨ ලෙස මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට සම්බන්ධ බවට වාර්තා වන කුමරන් පද්මනාදන් නමැත්තා රජයේ ආරක්ෂාව යටතේ ශ්‍රී ලංකාව තුළ වාසය කරන හෙයින්ද;

2013 අගෝස්තු මාසයේදී අග්‍රාමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ඊස්ට් ඒසියා ගේට්වේ ටර්මිනල් නමැති ආයතනයේ කළමනාකරු වෙත ලිපියක් නිකුත් කරමින්, බහලුමක් මුදා හරින ලෙස ඉල්ලා සිටි අතර එහි මත්ද්‍රව්‍ය අඩංගුව ඇති බව සොයා ගනු ලැබූ හෙයින්ද;

අදාළ සම්බන්ධීකරණ ලේකම්වරයාගේ 2013 දෙසැම්බර් මස 9 වැනි දිනැති ඉල්ලා අස්වීමේ ලිපිය මගින් ඔහු මෙම ගනුදෙනුවට සම්බන්ධ බව පෙනී යන හෙයින්ද;

මෙම ජාවාරම් කණ්ඩායම මුලිනුපුටා දමනු පිණිස ඉන්දියාවේ හා පකිස්ථානයේ බලධාරීන් සමග සම්බන්ධීකරණය වීමට රජය අසමත් වී ඇති හෙයින්ද;

මෙරටට හොරෙන් ගෙන ඒමේදී අල්ලා ගනු ලබන විශාල මත්ද්‍රව්‍ය තොග සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් කිරීමට රජය අසමත් වී ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය බෙදා හැරීම තුරන් කරනු පිණිස කිසිදු හරවත් ක්‍රියා මාර්ගයක් ගනු නොලබන හෙයින්ද;

මෙම උවදුර පාලනය කිරීමට හා මර්දනය කිරීමට රජය අකමැති බව පෙනී යන හෙයින්ද;

කිසිදු පරීක්ෂා කිරීමකින් තොරව බහලුම් මුදා හරිනු ලබන බවට වූ මෑත කාලීන වාර්තා මගින් පෙනී යන පරිදි, මෙම උවදුර බාධාවකින් තොරව දිගටම සිදු වන බව පෙනී යන හෙයින්ද;

මෙමගින් වර්ෂ 2500 කට වැඩි අභිමානවත් ඉතිහාසයක් පිළිබඳව උදම් අනන මෙම දේශයේ සාමාජීය හා ආර්ථික ව්‍යුහය කෙරෙහි විනාශකාරී ප්‍රතිවිපාක අත් වනු ඇති හෙයින්; සහ

මෙය අඛණ්ඩව සිදු වුවහොත් ශ්‍රී ලංකාව මත්ද්‍රව්‍ය රාජ්‍යයක් බවට පත් වී රටේ අනාගතය මහත් අනතුරකට පත් විය හැකි හෙයින්ද;

සිය පුරවැසියන්ගේ සුභසාධනය තහවුරු කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට රජයට ඇති හැකියාව පිළිබඳ විශ්වාසය බිඳ වැටී ඇතැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.